01. ජනතාවට අන්තර්ජාලය හරහා ඉල්ලුම් කළ හැකි "ඔබ කැමති වීඩියෝ"(Video - on - demand) පද්ධතියක් හඳුන්වා දීමට යම් සමාගමක් අදහස් කරයි. වීඩියෝ නිෂ්පාදකයන්ට වීඩියෝ නිෂ්පාදනය කර අනුමැතිය ලබා ගැනීම සඳහා මෙම සමාගමට ඉදිරිපත් කළ හැකිය. වීඩියෝවක් අනුමැතිය සඳහා සමාගමට ලැබුණු පසු එය විචාරණය කර වීඩියෝ පුස්තකාලය සඳහා අනුමැතිය ලබා දීමට විචාරක මණ්ඩලයක් සමාගම මගින් පත් කරනු ලැබේ. වීඩියෝවක් අනුමත වූ විට, එය වීඩියෝ පුස්තකාලය වෙත එකතු කරනු ලබන අතර, ඒ බැව් නිෂ්පාදකයා වෙත දන්වා යවනු ලැබේ. වීඩියෝවක් ප්‍රතික්ෂේප වූ විට ඒ සඳහා හේතු දක්වමින් වීඩියෝව අනුමත නොවූ බැව් ද නිෂ්පාදකයා වෙත දන්වා යවනු ලැබේ.

වීඩියෝ පුස්තකාලයේ ඇති වීඩියෝවල ලැයිස්තුවක් නරඹන්නන්ට පරිශීලනය කළ හැකි අතර වීඩියෝ වීඩියෝ සඳහා දායකත්වය ද ලබා ගත හැකිය. දායකත්වය ලබා ගත් අයට ඕනෑම වේලාවක විඩියෝ නැරඹිය හැකිය.

සෑම මසකම අවසානයේ දී, සමාගම විසින් සෑම දායකයෙකු සඳහා ම මාසික ගෙවීම ගණනය කරන අතර ඒ සඳහා වර්ණනාවක් (invoice) ද නිකුත් කරනු ලැබේ. මෙම වර්ණනාවන් සමාගමේ සේවයේ නියුතු ලිපි බෙදන්නෙකු මගින් සියලු දායකයන් වෙත යැවිය යුතු වේ.

පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු ලබා දෙන්න.

(අ) මෙම සංසිද්ධියේ භූථාර්ථ (entitie) මොනවාද?

(ආ) මෙම සංසිද්ධියේ නිරූපණය සඳහා සංදර්භ සටහනක් (context diagram) අඳින්න.

(ඇ) මෙම සංසිද්ධියේ ක්‍රියායක (processors) ලැයිස්තු ගත කරන්න.

(ඈ) අවශ්‍ය වන දත්ත ආචයන (data storages) මොනවා ද?

(ඉ) මෙම සංසිද්ධිය නිරූපණය කිරීම සඳහා පළමු මට්ටමේ දත්ත ගැලීම් සටහන (DFD) අඳින්න.